# මහායාන බුදුසමයාගත බෝධිසත්ත්ව පරමාදර්ශය

යෝධකණ්ඩියේ අරියවංස හිමි

This paper is discussed about the Bodhisattva idealism of Mahāyāna Buddhism. Mahayana Buddhism can be defined as a major movement in the history of Buddhism which has its origins in northern India. It is made up of many schools and reinterpretations of fundamental human beliefs, values and ideals not only those of the Buddhist teachings. Bodhisattva concept, Bodhi-citta (mind), altruism of Bodhisattva, pranidhāna, pathimoksha, laities of Mahāyāna Buddhism are deliberated to define the Bodhisattva idealism. Primary and secondary sources are used to accumulate the facts and analysed them to come to the conclusion.

## මහායාන බෝධිසත්ත්ව සංකල්පය

'බෝධි' යනු 'බුධ්' ධාතුවෙන් නිපන් අවබෝධය, වටහා ගැනීම, මාර්ග ඥානය, සර්වඥතා ඥානය, අවබෝධ කරන පුද්ගලයා, නිර්වාණය, අවබෝධයට ආධාර වූ වෘක්ෂය යන අර්ථය දෙන වචනයකි.[1] 'සත්ත්ව' යනු 'ස' පූර්ව 'ත්ත්ව' ධාතුවෙන් නිපන් පුද්ගලයා,[2] තැනැත්තා, සත්වයා වැනි අර්ථ නිරූපිත වචනයකි. බුදුවීමට පෙරුම්පුරන්නා, අවබෝධය ලැබීම පිණිස නියලෙන්නා, බුද්ධාංකුරයා, යන අරුත් බෝධිසත්ත්ව යන පදයෙන් නිරූපණය වේ. Har Dyal මහතා තම 'The Bodhisattva Doctrine in Buddhist Sanskrit Literature' නැමැති ග්‍රන්ථයෙහි බෝධිසත්ත්ව යන්නට බෝධිය වෙත නැමුණු තැනැත්තා (One who is devoted or attach to Bodhi), වික්‍රමාන්විත සත්ත්වයා (Heroic being), ආධ්‍යාත්මික ජයග්‍රාහකයා (Spiritïl warrior) යනුවෙන් වචනාර්ථ දක්වා ඇත.[3]

බෝධිසත්ත්ව සංකල්පය මහායාන බුදුදහමේ එන ප්‍රධානත ම සංකල්පයක් හෙවත් දර්ශනයකි. 'ප්‍රඥා පාරමිතා සූත්‍රය' බෝධිසත්ත්ව සංකල්පය මූර්තිමත්

කරන ප්‍රධාන මහායාන මූලාශ්‍රය වේ. 'බෝධි චිත්තය' උපදවාගැනීමත් සමග සෑම මහායානිකයෙක් ම බෝධිසත්ත්වයෙක් බවට පත්වේ. මුල් බුදුසමයාගත මූලාශ්‍රයවල ද බෝධිසත්ත්ව සංකල්පය පිළිබඳ කරුණු දැකිය හැකි මුත් මහායාන බෝධිසත්ත්ව සංකල්පය ඊට වෙනස් විග්‍රහයකි. මහායාන බුදුසමය සමාන්‍ය ජනයා අතර ප්‍රචලිත වීමට සෑම කෙනෙකුට ම බුදුවිය හැකි ය, ඒ සඳහා බෝධිසත්ත්වයෙක් විය යුතුය යන මෙම ආකර්ෂණීය ඉගැන්වීම් ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ. එහෙයින් බෝධිසත්ත්ව චරණය යනු බුදුවීමේ ප්‍රතිපදාව බව මහායානිකයන් පෙන්වා දේ. මුල් බුදුසමයාගත ඉගැන්වීම්වලට අනුව නිර්වාණාවබෝධය ලබාගත හැකි ආකාර තුනකි. එනම්;

1) බුද්ධ යානය
2) ප්‍රත්‍යෙක බුද්ධ යානය
3) ශ්‍රාවක යානය[4]

**බුද්ධ යානය** යනු සම්මා සම්බුද්ධත්වයට පත් වීමයි. එය බෝධිසත්ත්ව පරමාදර්ශයේ කූටප්‍රාප්තිය හෙවත් විශ්වීය සත්‍යාවබෝධය ලැබීමයි.

**ප්‍රත්‍යෙක බුද්ධ යානය** යනු පසේ බුද්ධත්වය යි. පසේ බුදුවරයෙකුට කිසිවෙකුගේ සහායකින් හෝ මඟපෙන්වීමකින් තොරව සත්‍යාවබෝධය ලැබිය හැකි වුව ද එය අන් අයගේ අවබෝධය පිණිස දේශනා කළ නොහැකි ය.

**ශ්‍රාවක යානය** යනු අර්හත්භාවයට පත් වීමයි. මහායාන බුදුසමය පසේ බුදු බව සහ අර්හත් බව පරම නිෂ්ඨාව ලෙස නොසලකති. සම්මා සම්බුදුවීමෙන් පමණක් පරම නිෂ්ඨාව වන නිර්වාණය අවබෝධ වන බව ඔවුන්ගේ පිළිගැනීමයි. ඒ අනුව සෑම මහායානිකයෙක් ම ශ්‍රාවක යානය හෝ ප්‍රත්‍යෙක බුද්ධ යානය හෝ නොව බුද්ධ යානය ම ප්‍රාර්ථනා කළ යුතු ය. බෝධිචර්යාවතාරය නම් ග්‍රන්ථයෙහි ඒ බව පහත පරිදි පෙන්වා දේ.

'ඉදං සුභාහු පෘච්ඡායාං - සොපපත්තික මුක්තවාන්
හීනාධිමුක්තිසත්වාර්ථාං - ස්වයමෙව තථාගතඃ'

(බෝධිචර්යාවතාරය; 1:20)

ශ්‍රාවක හා ප්‍රත්‍යෙක බුද්ධ යාන ප්‍රර්ථනා කරන්නේ දුර්වල වූ ප්‍රයත්න ඇත්තන් බව මහායානිකයක්ගේ පිළිගැනීම යි. (සර්වේසුර්බොධිභාගිනඃ) සියල්ලෝ ම බුදු බව ලබත්වා යනු ඔවුන්ගේ ප්‍රාර්ථනය යි. එහෙයින් සෑම මහායානිකයෙක් ම බුදුබව පතන බෝසත්වරයෙක ලෙස බෝධිසත්ත්ව චර්යාව හෙවත් බෝධි චිත්තය පූරණය කරයි. එය **බෝධිසත්ත්වයානය හෙවත් මහායානය** ලෙස හඳුන්වයි. බෝධි චර්යාව පුරන බෝසත්වරුන් තුළ පවතින විශේෂ ගුණ කිහිපයක් ප්‍රඥා පාරමිතා සූත්‍රයෙහි දැක්වේ. එනම්;

1) ශූන්‍යතාවයෙහි නිරතවීම
2) ආශාවන්ගෙන් තොරවීම

3) අනභිභවනීය අවබෝධය
4) නිශ්ශරණාධ්‍යාශයෙන් ධර්මය කියාදීම
5) මාර තර්ජන අභිභවනය කරන ආත්ම විශ්වාසය
6) ධර්ම විශ්ලේෂණයෙහි ප්‍රාගුණ්‍යය
7) අපමණ කලක් බුදුවීම පිළිබඳ ප්‍රාර්ථනා ඇතිබව
8) යථාර්ථාවබෝධය පැහැදිලි කරදීම
9) බුද්ධ ක්ෂේත්‍රවල ගමන් කිරීමේ ශක්තිය
10) බුද්ධායාචනය කිරීම[5]

තවද තමන් බුදුබව අවබෝධ කර ගැනීමට සහ අන්‍යයන් ද බුදුබව ලැබීම සඳහා යෙදවීමට බෝධිසත්ත්වයන් තුළ පවත්නා **'උපාය කෞශල්‍ය'** ගුණය ද සුවිශේෂ වූ ගුණාංගයකි. ප්‍රඥා පාරමිතා සූත්‍ර කේන්ද්‍ර කරගනිමින් බෝධිසත්ත්ව සංකල්පය සංවර්ධනය වී ඇත. ප්‍රඥා පාරමිතා සූත්‍ර අධ්‍යයනයේ දී පෙනී යන්නේ බෝධිසත්ත්වවරුන් සිව් (04) වර්ගයක් සිටින බවයි. එනම්;

1) ප්‍රඥා පාරමිතා පිළිබඳ අසා නැති බෝසත්වරු
2) ප්‍රඥා පාරමිතාව පිළිබඳ අසා ඇති බෝසත්වරු
3) අවනිවර්තනීය වෙනස් නොවන බෝසත්වරු
4) ප්‍රඥා පාරමිතාව පිළිබඳ පූර්ණ අවබෝධයක් ඇති බෝසත්වරු[6]

බෝසත්ත්වරුන්ගේ ආවසානික නිෂ්ඨාව වන බුද්ධ පදවිය ලැබිය හැකි වන්නේ ප්‍රඥා පාරමිතා සූත්‍රය පිළිබඳ පූර්ණ අවබෝධයක් ලැබූ බෝසත්ත්වරුන්ට පමණි. 'තථාගතයන් වහන්සේ ඉතා උසස් ම පාරමිතාව ලෙස දේශනා කළා වූ යමක් ඇත්ද, එය අපරිමිත භාග්‍යවත් බුදුරජාණන් වහන්සේලා විසින් ද ඉතා ම උසස් පාරමිතාව ලෙස දේශනා කරන ලද්දේ ය. එහෙයින් 'පරම පාරමිතාව' යැයි ද කියනු ලැබේ. (පරමාපාරමිතෙයං සුභූතෙ තථාගතෙන භාසිතා පාරමිතා)[7]

**මහායාන බෝධි චිත්තය**

**'බෝධි චිත්තය'** යනු අන්‍යයන් පිළිබඳ පවත්නා මහාකරුණාවත්, මහාප්‍රඥාවත් ය. බෝධි චිත්තය උපඳවාගත් බෝධිසත්ත්වයන්ට අන්‍යයන් වෙනුවෙන් කළ නොහැකි කිසිත් නොමැත. ආත්ම පරිත්‍යාගයෙන් වුව ද ඔවුහු පරහිතකාමී (Altruism) වෙති. ඒ අනුව බුදුවීමට බෝධි චිත්තය පූරණය කරන සෑම බෝධිසත්ත්වරයෙක් ම අසීමිත පරහිතකාමීත්වය පිළිබඳ බුද්ධි මහිමය හෙවත් අන්‍යයන්ගේ යහපත සඳහා ජීවත්වීම සහ ක්‍රියාකාරකම් සිදුකිරීම් නිරූපණය කරයි.[8] බෝධි චිත්තය ප්‍රධාන කොටස් දෙකකට බෙදා දක්වේ. එනම්;

1) බෝධි ප්‍රණිධි චිත්තය
2) බෝධි ප්‍රස්ථාන චිත්තය[9]

මේ දෙක අතර ඇති වෙනස ගමනක් යනු කැමති තැනැත්තා සහ ගමන යන තැනැත්තා අතර ඇති වෙනසට සමාන ය. **බෝධි ප්‍රණිධි චිත්තය** බෝධිචර්යාවට ම ප්‍රතිඥා දීමකි. **බෝධි ප්‍රස්ථාන චිත්තය** එම චර්යාවෙහි නිරතවීම ය. බෝධි චිත්තය පුරන්නේ බුද්ධත්වය ලැබීමට වුව ද බෝධි චිත්තය දැරීම අතිශය භාරදූර හා ගරු කටයුතු වූවකි. බෝධි චිත්තය උපදවාගත් තැනැත්තා දෙවියන් සහිත ලෝකයේ වන්දනයට සුදුස්සෙකි.

බෝධි චිත්තය මරණ දුක විනාශ කිරීමට බෙහෙතකි. දිළිදු බව නසන නිධානයකි. ලෙඩට ඖෂධයකි. සසර ගමනේ විඩාව සන්සිඳුවන වෘක්ෂයකි. දුගතියෙන් එතෙර කරවන ඒදණ්ඩකි. කෙලෙස් නැමැති ග්‍රීෂ්මයට සඳකි. අනුවණ නැමැති අඳුර දුරලන සූර්යයෙකි. සද්ධර්මය නැමැති කිරි සයුර කැළඹීමෙන් උපන් වෙඬරු පිඬකි. එහෙයින් බෝධි චිත්තය පිරීම සඳහා දෙන ප්‍රතිඥාව කඩ කිරීම මහත් පාපයක් බව මහායානිකයන්ගේ විශ්වාස යයි. ශාන්තිදේව පාදයන්ගේ බෝධිචර්යාවතාරයෙහි ප්‍රතිඥාව කඩ කිරීමේ භයානක කම මෙසේ දක්වයි.

'චිරං ධක්ෂ්‍යති මෙ කායං - නාරකාග්නීඃ සුදුඃසහඃ
පශ්චාත්තාපානලශ්-චිත්තං - චිරං ධක්ෂ්‍යත්‍යශික්ෂිතම්'

(බෝධිචර්යාවතාරය; 3:25)

ප්‍රතිඥාව කඩ කිරීමේ විපාක වශයෙන් කය නිරා ගින්නෙන් ද, සිත පසුතැවිල්ලෙන් ද දවනු ලැබේ. ප්‍රතිඥාව කඩ කිරීම එතරම් ම භයානක ය.

බෝධිසත්ත්ව පරාර්ථචර්යාව

බෝධිසත්ත්ව පරාර්ථචර්යාව හෙවත් පරහිතකාමී (Altruism) බව බෝධි චිත්තයේ ප්‍රධාන අංගයකි. පරාර්ථකාමීත්වය පිළිබඳ බෝධිචර්යාවතාරයෙහි එන විවරණ කිහිපයක් මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමු.

'ආත්මභාවාංස්තථා භොගාන් - සර්වත්‍ර්‍යධ්වගතං ශුභං
නිරපෙක්ෂස්ත්‍යජම්‍යෙෂ - සර්වසත්වාර්ථසිද්ධියෙ'

(බෝධිචර්යාවතාරය; 3:10)

බෝධිසත්ත්වයෙකු වන මම මාගේ ශරීරය ද, උපභොග පරිභෝග වස්තූන් ද, අතීත, වර්තමාන සහ අනාගත යන කාලත්‍රයෙහි ම මා විසින් කරන ලද සියලු කුසල් ද, කිසිඳු අපේක්ෂාවකින් තොරව සියලු සත්ත්වයන්ට අර්ථ සිද්ධිය සඳහා පරිත්‍යාග කරමි. අත්හරිමි.

'යථා සුඛී කෘතශ්චාත්මා - මයා යං සර්ව දෙහිනාං
ඝ්නන්තු නින්දන්තු වා නිත්‍ය - මාකිරන්තු ච පාංශුභිඃ'
'ක්‍රීඩන්තු මම කායෙන - හසන්තු විලසන්තු ච

දත්තස්තෙභ්‍යො මයා - කායශ්චින්තයා කිං මමානයා'
'කාරයන්තු ච කර්මාණි - යානි තෙෂාං සුඛාවහං
අනර්ථඃ කස්‍යචින්මාභූත් - මාමාලම්භ්‍ය කදාචන'

(බෝධිචර්යාවතාරය; 3:12,13,14)

මා විසින් සියලු සත්වයන්ට මාගේ මේ ශරීරය කැමැති පරිදි සැප ලබා ගැනීම සඳහා පරිත්‍යාග කරන ලදි. ඔවුහු මාගේ ශරීරය පීඩා කෙරෙත්වා. නින්දා කෙරෙත්වා. නිතර දූවිලි ආදිය ඉසිත්වා. මාගේ ශරීරයෙන් ක්‍රීඩා කෙරෙත්වා. සිනාසෙත්වා. සැරසීම හෝ කෙරෙත්වා. මාගේ මේ සිරුර නිසා ඔවුන්ට යම් සැපයක් ගෙන දේ ද එය ම කෙරෙත්වා. එහිදී ඔවුනට මා නිසා අනර්ථයක් නොවේවා යනුවෙන් සිතමින් තමා දුකට පත්වී අනුන්ගේ සැපත අපේක්ෂා කරන බෝසත්වරුන් තම ශරීරය සකලාකාරයෙන් ම ලෝකයාගේ සැපත වෙනුවෙන් පරිත්‍යග කිරීම බෝධි චිත්තයේ පවත්නා උත්තරීතර බවයි.

දීපාර්ථිනාමහං දීපඃ ශය්‍යා ශය්‍යාර්ථිනාමහං
දාසාරථිනාමහං දාසො භවෙයං සර්වදෙහිනාංම්
(බෝධිචර්යාවතාරය; 3:18)

බෝධිසත්ත්වයෝ ආලෝකය කැමැත්තවුන්ට පහණක් වීමට ද, සැතපෙනු කැමැත්තන්ට යහනක් වීමට ද, දාසයන් අවශ්‍ය වූවන්ට දාසයෙකු වීමට ද සූදානම් ය. මෙවන් උතුම් ගුණ ඇති බෝසතුන් පිළිබඳ ව යමෙක් පැහැදේ නම් ඉන් කුසල් ද, යමෙක් පව්ටු සිතිවිලි උපදවා ගනිත් නම් ඉන් අකුසල් ද වේ. ඔවුන් තම නිවන් අවබෝධ කිරීම කල්දමා අන්‍යයන්හට උපකාර කිරීමෙහි නිරතව සිටිති. බෝධි චිත්තයේ අගය කෙබඳු ද යන්න මෙමඟින් විද්‍යමාන වේ.

සෑම මනුෂ්‍යයෙකුට ම බෝධි චිත්තය උපදවාගත හැකි ය. එය උපදවා ගත් සියල්ලෝ ම බෝධිසත්ත්වයෝ වෙති. බෝධි චිත්තය මුකුලිතව හැකිලී පවතින්නකි. බුදුවරුන් තුළ පමණක් එය ප්‍රබෝධමත් ය. බෝසත්වරුන්ට බෝධි චිත්තය ප්‍රබෝධමත් කරගත හැකි ක්‍රම සතරක් මහායාන අභිධර්ම සමුච්චයෙහි දක්වේ. එනම්;

1) බුදුවරු පිළිබඳ මෙනෙහි කිරීම
2) සසර දුක පිළිබඳ මෙනෙහි කිරීම
3) සත්වයා දුකට පත්වන කරුණු පිළිබඳ සිහි කිරීම
4) තථාගත ගුණ අනුස්මරණය කිරීම[10]

තවද බුදුවරුන්ට වන්දනා කිරීමෙන්, පූජා පැවැත්වීමෙන්, පව් සමා කිරීමෙන්, පිං අනුමෝදන් වීමෙන්, සියලු බුදුවරුන්ට නමස්කාර කොට සත්ත්වයන් සසර දුකින් මුදවන ලෙස ආයාචනා කිරීමෙන් (බුද්ධාධ්‍යෙෂණ), සියලු සතුන්ට නිර්වාණාවබෝධ වේවායි අයැද සිටීමෙන් (බුද්ධයාචන) සහ සත්ත්වයන්ගේ දුක දුරු කිරීම සඳහා

බුදුබව ප්‍රාර්ථනා කිරීම (බෝධිපාචනා) යන සප්ත (07) ක්‍රම මගින් ද බෝධි චිත්තය ප්‍රබෝධමත් කළ හැකි බව බෝධිචර්යාවතාරයෙහි පෙන්වා දෙයි.

**බෝධිසත්ත්ව ප්‍රණිධාන ව්‍රතය**

බුදුවීමට පිළිවෙත් පූරණය කරන බෝසත්වරුන් බෝධි චිත්තය උපදවාගෙන මහත් කරුණාවෙන් සහ දයාවෙන් අපරිමිත ලෝක සත්ත්වයාගේ ම යහපත සඳහා තම ආත්ම පරිත්‍යාගයෙන් කටයුතු කිරීමට ප්‍රණිධාන නම් ව්‍රතයක් සමාදන් වේ. ප්‍රණිධාන යනු සිත පිහිටු වීම හෙවත් පැතීමයි.[11] මහායාන අවතංස සූත්‍රයෙත්, දශ භූමික සූත්‍රයෙත් මේ සම්බන්ධ තොරතුරු සඳහන් වේ. ප්‍රණිධාන ව්‍රතය සංඛ්‍යාත්මක ව දහය (10) කි. එහෙයින් දශ ප්‍රණිධාන ව්‍රතය වශයෙන් දත යුතු ය. එම දශ ප්‍රණිධාන ව්‍රතය මෙසේ ය.

1) මා විසින් රැස් කරන ලද පුණ්‍ය ධර්මයෝ සියලු සත්ත්වයන්ට පිහිටා ඔවුන් ද බෝධි චිත්තය වඩත්වා යනුවෙන් සිතීම.
2) මාගේ කුසල බලයෙන් සියලු සත්ත්වයෝ බෝසත් ව, බුදුන් හමුවට ගොස් බුද්ධෝපස්ථාන කරත්වා යනුවෙන් සිතීම.
3) සියලු සත්ත්වයෝ බුදුවරුන් සමීපයෙහි ම වසත්වා යනුවෙන් සිතීම.
4) බුදුවරු සියලු සත්ත්වයන්ට ම අවබෝධය පිණිස චතුරාර්ය සත්‍යය දේශනා කරත්වා යනුවෙන් සිතීම.
5) සියලු සත්ත්වයෝ ම සත්‍යය ධර්මාවබෝධ ඥානය ලබත්වා යනුවෙන් සිතීම.
6) සියලු සත්ත්වයන්ට ම අවබෝධය පිණිස ධර්ම දේශනා කිරීමට මට හැකි වේවා යනුවෙන් සිතීම.
7) බුද්ධක්ෂේත්‍රවල වැඩ වෙසෙන සියලු බුදුවරුන්ගේ බුද්ධානුබලයෙන් සියලු සත්ත්වයෝ සුවපත් වේවා යනුවෙන් සිතීම.
8) සියලු සත්ත්වයෝ ම ධර්මය අසා, බෝධි චිත්තය උපදවා ගනිත්වා යනුවෙන් සිතීම.
9) සියලු කල්හි සියලු සත්ත්වයෝ බෝධි චිත්තය ද, ධර්මය ද පුරුදු කරත්වා යනුවෙන් සිතීම.
10) සියලු බෝධිසත්ත්වයෝ ම සියල්ලන්ගේ ම යහපත් පිණිස සත්‍යය ධර්මය ම පුරුදු කරත්වා යනුවෙන් සිතීම.[12]

බෝධිසත්ත්වවරුන් විසින් සෑම නිමේෂයකදී ම මෙම ප්‍රණිධාන ව්‍රතය සිහිකළ යුතු ය. එමඟින් බෝධිසත්ත්ව චර්යාව පිළිබඳ සිත පිහිටුවීමත්, බෝධි චිත්තය ප්‍රමෝදයට හෙවත් ආධ්‍යාත්මික ප්‍රීතියට පත් වීමත් සිදුවේ.

## මහායාන බෝධිසත්ත්ව ප්‍රාතිමෝක්ෂය

බුදුවීමට පාරමිතා පූරණය කරන බෝධිසත්ත්වවරුන් විසින් අනුගමනය කළයුතු වත්පිළිවෙත් සහ චාරිත්‍රවිධි බෝධිසත්ත්ව ප්‍රාතිමෝක්ෂය ලෙස හඳුනාගත හැකි ය. මහායාන සූත්‍ර සාහිත්‍යයෙහි මේ පිළිබඳ දක්වෙන විනය සූත්‍ර දේශන හමුවේ. එම ග්‍රන්ථවල බෝසත්වරු විසින් අනුගමනය කළයුතු විනය ශික්ෂා ලෙස මෙය හඳුන්වන අතර ප්‍රධාන ශික්ෂාපද හතරක් සහ නො කළ යුතු අනු ශික්ෂාපද හතළිසක් බෝධිසත්ත්ව ප්‍රාතිමෝක්ෂයට හෙවත් විනය ශික්ෂාවලට ඇතුළත් වේ.

1) ලාභ සහ ගෞරව ලැබීම පිළිබඳ තෘෂ්ණාවෙන් දුරුවීම කළ යුතු ය.
2) දන් දීමේදී සහ ශිල්ප ඉගැන්වීමේදී මසුරු කම් නොකළ යුතු ය.
3) අන්‍යයන් සමග අමනාප නොවීම, නුරුස්නා නැති බව සහ වරදට සමාව ඉල්ලීමේදී එය පිළිගැනීම කළ යුතු ය.
4) අන්‍යයන්ට අපහාස වන දේ කියන විට එය වර්ණනා කිරීම නොකළ යුතු ය.[13]

බෝධිසත්ත්ව ප්‍රාතිමෝක්ෂ ලෙස සැළකෙන නොකළ යුතු අනු ශික්ෂා හතළිහ නම්; තෙරුවන් නොඇදහීම, ලාභ තෘෂ්ණාව, වැඩිහිටියන්ට ගරු නොකිරීම, ආරාධනා නොපිළිගැනීම, ත්‍යාග නොපිළිගැනීම, ඉල්ලීමක් කරන විට උපදෙස් නොදීම, මනුෂ්‍යයන් ශික්ෂා කඩන විට ඔවුන් අතහැරීම, පාපක්‍රියා කරන අය ආරක්ෂා කිරීම, පව්කම්වලට ඉඩ සැලසීම, දුෂ්ට ක්‍රම අත් නොහැරීම, ශාන්ත බව නොදක්වීම, නිර්වාණය කෙරෙහි මහත් සොම්නසක් නොවීම, අපකීර්තිය ආරක්ෂා නොකිරීම, චිත්ත පීඩාවලට උදව් කිරීම, පළිගැනීම, පාපෝච්චාරණය නොකිරීම, සමාව නොපිළිගැනීම, අනුන්ට ද්වේශ කිරීම, නිකරුනේ කාලය කා දැමීම, උපදෙස් නොගැනීම, ලෞකික ධ්‍යානවලින් සතුටු වීම, ශ්‍රාවකයාන (අර්හත්වය) පිළිකුල් කිරීම, බෝධිසත්ත්ව පිටකය නොහැදෑරීම, මිත්‍යාදෘෂ්ටික ග්‍රන්ථ අධ්‍යයනය කිරීම, මිත්‍යාදෘෂ්ටික සංකල්පවලට කැමැතිවීම, බෝධිසත්ත්ව පිටකයේ ගැඹුරු අර්ථවලට නින්දා කිරීම, ආත්ම වර්ණනායට කැමැතිවීම, ධර්මයට සවන් නොදීම, දේශකයා පිළිකුල් කිරීම, අනුන්ට සහාය නොවීම, ගිලනුන් බලා නොගැනීම, වැරදි කරුවන් නිවැරදි කරුවන් ලෙස පිළිගැනීම, කාරුණික නොවීම, දුකට පත් වූවන් සැනසීමට පත් නොකිරීම, ත්‍යාගශීලි නොවීම, තම ඉගැන්වීම් සිසුන්ට කියා නොදීම, අනුන්ගේ අදහස්වලට ගරු නොකිරීම, සැබෑ සිල්වතුන් අගය නො කිරීම, නීති ගරුක නොවීම, අන්‍යයන්ගේ ආකර්ශනය පිණිස තම ප්‍රතිපදාවන් යොදා ගැනීම.[14]

## මහායාන බෝධිසත්ත්වවරු

මහායාන ධර්මයේ බෝසත්වරුන්ට විශේෂ තැනක් හිමි වේ. ඔවුන් දෙවැනි වන්නේ බුදුරජාණන් වහන්සේට පමණි. මහායානිකයන් පළමු ව බුදුරජාණන්ට ද දෙවැනි ව බෝධිසත්ත්වයන්ට ද නමස්කාර කරති. පසේ බුදුවරුන්ට සහ රහතන් වහන්සේලාට නමස්කාර කරනුයේ ඉන් පසුව ය. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ එන පහත සඳහන් පාඨයෙන් එය ප්‍රකට වේ.

'නමඃ බුද්ධ බෝධිසත්වාර්ය ශ්‍රාවක ප්‍රත්‍යෙක බුද්ධාභ්‍යාං'[15]

මහායානිකයෝ බෝධිසත්ත්වරුන්ට දෙවියන් මෙන් වඳිති, පුදති, ඉමහත් ලෙස ගරු කරති. මහායාන සූත්‍ර සාහිත්‍යයෙහි බෝසත්ත්වරුන් විශාල සංඛ්‍යාවක් සිටින බව පැවසෙන අතර බෝසත්වරුන්ගේ නම් ද රාශියක් සඳහන් ව ඇත. ඉන් ප්‍රධාන බෝධිසත්ත්වරුන් අට (08) දෙනෙකුගේ නම් සහ එම බෝසත්වරුන්ගේ ස්වභාවයන් පමණක් මෙහිදි සඳහන් කොට ඇති බව දත යුතු ය.

1) සමන්තභද්‍ර බෝධිසත්ත්වයෝ
2) වජ්‍රලාණි බෝධිසත්ත්වයෝ
3) විශ්වපාණි බෝධිසත්ත්වයෝ
4) අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයෝ
5) ආකාශ-ගර්භ බෝධිසත්ත්වයෝ
6) ක්ෂිති-ගර්භ බෝධිසත්ත්වයෝ
7) මෛත්‍රෙය බෝධිසත්ත්වයෝ
8) මංජු ශ්‍රී බෝධිසත්ත්වයෝ

**සමන්තභද්‍ර බෝධිසත්ත්වයෝ**

මහායාන බෝධිසත්ත්ව මණ්ඩලයේ දීර්ඝායුෂ ලබා දීමේ විශේෂ බලයක් ඇති කරුණාව මූර්තිමත් කරන බෝධිසත්ත්වයන් වන්නේ සමන්තභද්‍ර බෝධිසත්ත්වයෝ ය.

මෙම බෝධිසත්ත්වයන්ගේ හිස මත ඔටුන්නක් ද, ශරීරයේ බොහෝ ආභරණ ද, වම් අතේ චින්තාමණියක් හෝ නීලෝත්පලයක් හෝ දරයි. දකුණු අතේ විතර්ක මුද්‍රාව ඇත්තේ ය. සමහර විට ආසනයක හිඳිමින් ද, සමහර විට සිටිමින් ද, වර්ණ වශයෙන් පලාවන් පැහැය ද, කහ පැහැය ද දරන්නේ ය. පසුකාලීනව නිර්මාණය කරන ලද සමන්තභද්‍ර බෝධිසත්ත්ව රූපයේ චින්තාමාණිය ඇත්තේ හිස මත ය. ජපානය සහ චීනය වැනි රටවල සමන්තභද්‍ර බෝධිසත්ත්වයෝ නිරූපණය කරන්නේ ශාක්‍යමුනි බුද්ධ හා මංජු ශ්‍රි බෝධිසත්ත්වයන් සමඟ ත්‍රිත්වයක් වශයෙනි. එහි ශාක්‍යමුනි බුදුන්ගේ දකුණු පසින් සමන්තභද්‍ර බෝධිසත්ත්වයන් නිරූපණය කෙරේ.[16]

**වජ්‍රපාණි බෝධිසත්ත්වයෝ**

වර්ෂාව වැස්සීමටත්, ගුරුළන්ගෙන් සහ නාගයන්ගෙන් ආරක්ෂාව සැලසීමටත් විශේෂ ශක්තියක් ඇති බෝධිසත්ත්වයෙකු ලෙස වජ්‍රපාණි බෝධිසත්ත්වයන් මහායානිකයන්ගේ ගෞරවයට සහ වන්දනාවට පාත්‍ර වේ.[17]

දකුණු අතින් වජ්‍රයක් ද, වමතින් වරද මුද්‍රව ද දරමින්, පද්මාසනයක දකුණු කකුල නමාගෙන වැඩ සිටින (හිටි පිළිම ද ඇත) සේ නිරූපිත වජ්‍රපාණි බෝසත්

ප්‍රතිමා බොහෝ විට සුදු පැහැයෙන් යුත් නමුදු සමහර විට රතු පැහැයෙන් ද යුක්ත ය. මහායාන බුදුදහම ප්‍රචලිත සෑම රටකට වජ්‍රපාණි බෝසත් ප්‍රතිමා දැකිය හැකි ය.

**විශ්වපාණි බෝධිසත්ත්වයෝ**

සියලු ලෝ වැසියන්ගේ සා පිපාසාදි හිරිහැර වැළකීමේ ශක්තියක් ඇති විශ්වපාණි බෝධිසත්ත්වයන් වහන්සේ පිළිබඳ තොරතුරු මහායාන ග්‍රන්ථවල දැකිය හැකි වන්නේ මඳ වශයෙනි.

සියලු බෝධිසත්ත්ව ආභරණ පැලැඳ සිටින විශ්වපාණි බෝධිසත්ත්වයන් වහන්සේ වම් අත විවෘතව උකුල මත ද, දකුණු අතින් වජ්‍රය ද දරමින් සිටින විශ්වපාණි බෝධිසත්ත්වයෝ මෙත් බුදුන්ගේ පහළ වීම අපේක්ෂාවෙන් භාවනානුයෝගී ව වැඩ සිටින බව මහායානිකයන්ගේ විශ්වාසය යි.[18]

**අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයෝ**

මහායාන බෝධිසත්ත්ව මණ්ඩලයේ වැඩි ගෞරවයට සහ ජනප්‍රියත්වයට පත් අවලෝකිතේශ්වර බෝසතුන් සමස්ත විශ්වය ම බලන ප්‍රධානියා ලෙස පිළිගනිති. මහා කරුණාවේ ප්‍රතිමූර්තිය ලෙස ද හඳුන්වති.

මෙම බෝධිසත්ත්වයන් නිරූපණය කෙරෙන ප්‍රතිමා විවිධ ස්වරූප ගනියි. සමහර ප්‍රතිමාවක එක හිසකි, අත් හතරකි, සමහර තැනෙක අත් දහයකි. තවත් තැනෙක හිස් තුනක් හා ඇස් තුනක් ද, අත් සතරක් ද දක්නට ලැබේ. තවත් තැනෙක හිස් පහක් ද, ඇස් තුනක් ද, අත් සූවිස්සක් ද දක්නට ලැබේ. අත් දහසක් ඇති අවතාර නිරූපණයේදී කඩුවක් සහ පලිහක් දැරූ දෑතක් හිස උඩ ඇත. ඉදිරියෙහි නාගයෙකු සේ දරණ වැලකි. විශේෂයෙන් දකුණතින් නෙලුමක් ගෙන සියලු රාජකීය ඇඳුම් ආයිත්තම්වලින් සැරසී රාජකුමාර විලාසයෙන් ද, විටෙක යෝගි ස්වභාවයෙන් ද පෙනී සිටින හිටි සහ හිඳි ප්‍රතිමා දක්නට ලැබීම අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන්ගේ සුවිශේෂත්වය විද්‍යාමාන කරවයි. තවද මෙම බෝධිසත්ත්වයන්ට විවිධ සම්ප්‍රදායවල විවිධ නම් භාවිත වේ.[19]

**ආකාශ ගර්භ බෝධිසත්ත්වයෝ**

මහාප්‍රඥාවෙන් හා කරුණාවෙන් පරිපූර්ණ වන මෙම බෝධිසත්ත්වයන් අවකාශය වට කරනු ලබන තැනැත්තා යන අර්ථයෙන් ආකාශ ගර්භ නම් **වේ. තම අනුගාමිකයන්ට පවත්නා බාධක** දුරු කොට, වැරදිවලින් මුදවාලීම ආකාශ ගර්භ බෝසතුන්ගේ පාරමිතාව වේ.

ධ්‍යානී බුදුවරුන් සංකේතවත් කරන ඔටුන්නක් පැලඳ, ආභරණවලින් සැරසී, දකුණතින් චින්තාමාණික්‍ය ද, වමතින් නෙළුමක් ද දරමින්, පද්මයක් මත වැඩ සිටින මෙම බෝසතුන්ගේ ප්‍රතිමා දුර්ලභ ය. චීන හා ජපානය වැනි රටවල ප්‍රතිමා **විරල වශයෙන් දක්නට ලැබේ.**[20]

**ක්ෂිති ගර්භ බෝධිසත්ත්වයෝ**

පෘථිවියට අධිපති වූ ක්ෂිති ගර්භ බෝධිසත්ත්වයෝ අපාගත සත්ත්වයන්, යුධකාමී සත්ත්වයන් සහ කුසගින්නේ දුවෙන භූතයන් එම දුකෙන් මුදවාලන මහාබලසම්පන්න බෝසත්වරයෙක් වෙති. මොහු වන්දනා කිරීමෙන් ඊළඟ ආත්මයේ සුන්දර මුහුණු ලබන බවට **විශ්වාසයක් පවතියි.**

ප්‍රසව වේදනාවෙන් පෙලෙන ස්ත්‍රීන්ට පිහිට වන මෙම බෝධිසත්ත්වයන් දකුණතින් ශුද්ධ වූ මාණික්‍යයක් ද, වමතින් ත්‍යාග වරදමුද්‍රාව ද, පෙන්නුම් කරමින් මනරම් ආභරණයෙන් සැරසී සිටින ප්‍රතිමා ජපානයේ බහුල වශයෙන් දැකිය හැකි ය.[21]

**මෛත්‍රෙය බෝධිසත්ත්වයෝ**

බෝධිසත්ත්වවරුන් අතරින් ථෙරවාද සහ මහායාන යන සම්ප්‍රදායන් දෙකෙහි ම ගෞරවාදරයට පාත්‍ර වන එකම බෝසතුන් වන්නේ මෛත්‍රෙය (මෙත්) බෝසතාණෝ ය. ගෞතම බුදුන්ගෙන් පසු මතු බුදුවන බෝධිසත්ත්වයන් ලෙස සම්ප්‍රදායන් දෙකෙහි ම පිළිගැනීම එයට හේතුව යි. ගෞතම බුදුරදුන් තුසිත දෙව්ලොවට වැඩම කළ අවස්ථාවේ දී තුසිත දෙව්ලොව වසන මෛත්‍රෙය බෝධිසත්ත්වයන් මුණගැසුණු බවත්, තමන්ගෙන් පිරිණිවීමෙන් පසු බුද්ධත්වයට පැමිණ මිනිස් ලෝකයට සත්‍ය දේශනා කරන ලෙස නියම කළ බවත් සඳහන් වේ.

මෙත් බෝසතුන්ගේ ප්‍රතිමාවල විතර්ක මුද්‍රාව සහ වර මුද්‍රාව ද, සමහර විට ධර්මචක්‍ර මුද්‍රව ද නිරූපණය කරයි. රජ කුමාරයෙකු සේ ආභරණයන් සහ ඔටුණු පැලඳ සිංහාසනයක වැඩ සිටින අයුරු නිරූපිත ප්‍රතිමා බොහෝ රටවල දැකිය හැකි ය.[22]

**මංජු ශ්‍රී බෝධිසත්ත්වයෝ**

නුවණට අධිපති **බෝධිසත්ත්වයන් වන මංජු ශ්‍රී - ශාක්‍යමුණි බුද්ධ හා සමන්තභද්‍ර බෝධිසත්ත්වයන් සමග** ත්‍රිත්වයක් වශයෙන් දැකිය හැකි ය. මංජු ශ්‍රී බෝධිසත්ත්වයෝ බුදුවීමට පෙරුම් පුරන බෝසත්වරුන්ට මවක්, පියෙක්, සහෝදරයෙක් සහ මිත්‍රයෙක් ලෙස සහය වන බව මහායානිකයන්ගේ විශ්වාසය යි.

දකුණු අතේ තීක්ෂණ ඥානය සංකේතවත් කරන කඩුවක් ද, වම් අතේ ප්‍රඥාපාරමිතා පුස්තකය ද, නොයෙකුත් විසිතුරු ආභරණ ද පලඳින, මංජු ශ්‍රී බෝධිසත්ත්වයෝ මහාරාජලීලාවෙන් වැඩ සිටින ප්‍රතිමා චීනය සහ ජපානය වැනි රටවල බහුල වශයෙන් දැකිය හැකි ය.[23]

**මහායාන බෝධිසත්ත්ව දෙවඟනන්**

බෝසත්වරුන් මෙන් ම බෝසත්වරියන් ද මහායානිකයන්ගේ ගෞරවයට සහ වන්දනාවට ලක්වීම මහායාන බුදුසමයේ පවත්නා විශේෂත්වයයි. බෝධිසත්ත්ව දෙවඟනන් බොහෝමයකගේ නම් මහායාන ග්‍රන්ථවල දැකිය හැකි ය. එම බෝධිසත්ත්ව දෙවඟනන් කිහිප දෙනෙකුගේ නම් පහත පරිදි සඳහන් කරනු

කැමැත්තෙමි. බුදුවීමට පෙරුම් පුරන එම බෝධිසත්ත්ව දෙවඟනන් ප්‍රකට කරන්නේ කාන්තාවන්ට ද බුදුවිය හැකිය යන මහායාන මතය යි.

1) තාරා බෝධිසත්ත්ව දෙවඟන
2) ප්‍රඥා බෝධිසත්ත්ව දෙවඟන
3) මහාමයුරී බෝධිසත්ත්ව දෙවඟන
4) මාරීචි බෝධිසත්ත්ව දෙවඟන
5) චින්තා බෝධිසත්ත්ව දෙවඟන[24]

**තාරා බෝධිසත්ත්ව දෙවඟන**

මහායාන බෝධිසත්ත්ව මණ්ඩලයේ දක්නට ලැබෙන ප්‍රථම කාන්තා නියෝජනය තාරා බෝධිසත්ත්ව දෙවඟන යි. මහායානිකයන් දේවත්වයෙන් වන්දනා කරන තාරා බෝධිසත්ත්ව දෙවඟන සත්ත්වයන් සංසාරයෙන් එතෙර කරලීමට සහාය වන්නීය.

දකුණතින් වරද මුද්‍රාව ද, වමතින් විතර්ක මුද්‍රාව සහිත නෙළුමක් ද ගත්, දකුණු පාදය ඉදිරියට විහිදුවා වැඩ සිටින තාරා බෝසත් පිළිම තිවංක වන අතර උඩුකය නිරුවත් ය. කේශ කලාපය උඩට බැඳ ඇති අතර ශිරසේ ඇති කිරීටයෙහි අමෝඝසිද්ධි ධ්‍යානී බුද්ධ ප්‍රතිමාව ද, නළලෙහි ඌර්ණ රෝමය ද දක්නට ඇත. අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන්ගේ ප්‍රතිමූර්තිය ලෙස සලකන තාරා බෝසත් දෙවඟන අමිතාභ බුදුන්ගේ ඇසින් නැඟුණ නීලවර්ණ රශ්මියකින් උපන් බව කියවේ. මූර්තිවලින් නිරූපිත සුදු, රතු, කොළ, කහ සහ නිල් වර්ණයන්ගෙන් යුත් තාරා බෝසත් දෙවඟන අක්ෂෝභ්‍ය, රත්නකේතු, අමිතාභ, අමෝඝසිද්ධි, වෛරෝචන යන ධ්‍යානී බුදුවරුන් පස් දෙනා වහන්සේ සංකේතවත් කරති. තවද ශ්වේත (සුදු) වර්ණයෙන් ප්‍රඥාව ද, හරිත (කොළ) වර්ණයෙන් ක්‍රියාශීලී බවද නිරූපණය වේ. මහායාන බුදුදහම ප්‍රචලිතව පවත්නා සෑම රටකම තාරා බෝසත් දෙවඟනගේ චිත්‍ර සහ මූර්ති දැකිය හැකි වන අතර ශ්‍රී ලංකාවේ ද ත්‍රිකුණාමලය, බුදුරුවගල, විජයාරාමය, දඹදෙණිය යන ස්ථාන කැණීම්වලින් තාරා බෝසත් ප්‍රතිමා හමු වී ඇත.[25]

මහායාන බෝධිසත්ත්ව මණ්ඩලයේ පිරිමි බෝධිසත්ත්ව ප්‍රතිමාවල ආභරණ පැළඳ සිටිනු බහුලව දැකිය හැකි මුත් ප්‍රථම කාන්තා නියෝජනය වන තාරා බෝසත් දෙවඟනගේ ප්‍රතිමාවල ආභරණ දැකිය නො හැකිවීම විශේෂත්වයකි. තවද අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන් හැරුණු විට යෝගී ලීලාව වැඩි වශයෙන් ප්‍රකට කෙරෙන අනෙකුත් බෝධිසත්ත්ව ප්‍රතිමාව වන්නේ ද තාරා බෝධිසත්ත්ව දේවඟනගේ ප්‍රතිමා පමණක් වීම ද විශේෂත්වයකි.

**ප්‍රඥා බෝධිසත්ත්ව දෙවඟන**

ප්‍රඥා බෝධිසත්ත්ව දේවඟන හෙවත් ප්‍රඥා පාරමිතා දේවී වශයෙන් හඳුන්වන මෙම දෙවඟන බුදුවන තෙක් සියලු සත්ත්වයන් ආරක්ෂා කරන බව මහායානිකයන්ගේ

විශ්වාසය යි. ප්‍රඥා පාරමිතා සූත්‍රයට දක්වන ගෞරවය ම ප්‍රඥා බෝධිසත්ත්ව දෙවඟනට දක්වනු දැකිය හැකි ය.

එක් හිසක්, අත් දෙකක් සහ අත් සතරක් ඇති ප්‍රතිමා ද දැකිය හැකි ය. අත් දෙකක් සහිත ප්‍රතිමාවල ධර්මචක්‍ර මුද්‍රව ද, ඇතැම් තැනක අතින් පුස්තකයක් ද දරන්නීය. එම පුස්තකය ප්‍රඥා පාරමිතා සූත්‍රය සංකේතවත් කරනවා විය යුතු ය. අත් දෙකක් සහිත ප්‍රතිමාවල නිල්මහනෙල් (නීලෝත්පල) මල් පැලඳ සිටින අතර අත් සතරත් ඇති ප්‍රතිමාවල එක් අතකින් නිල්මහනෙල් මල් පොකුරක් දරනු නිරූපණය වේ. ශ්වේත සහ පීත යන වර්ණ දෙකෙන් ම ප්‍රතිමා දැකිය හැකි ය. ජපානය, කාම්බෝජය සහ ටිබෙටය වැනි රටවල මෙම ප්‍රතිමා බහුලව දැකිය හැකි ය.[26]

### මහාමයූරී බෝධිසත්ත්ව දෙවඟන

විද්‍යා දෙවඟන ලෙස ද හඳුන්වන මහාමයූරී බෝධිසත්ත්ව දෙවඟන සැඟවුණු ආරක්ෂක මන්ත්‍ර බලයකින් සියලු සත්ත්වයන් ආරක්ෂා කරන බව පැවසේ. මෙම බෝසත් දෙවඟන අදහන්නන්ට සර්පයන් දෂ්ට නො කරති.

හිස් තුනක් සහ අත් හයක් ඇති මහාමයූරී බෝධිසත්ත්ව දෙවඟනගේ ප්‍රතිමාවල අමෝඝසිද්ධි බුදුන් හිසින් දරනු සිටිති. දකුණු අතකින් වරද මුද්‍රාව ද, වමතකින් පුන් කලසක් ද දරා සිටින ඇයගේ අනෙක් අත් වලින් දුන්නක් ද ඊතලයක් ද, සිකිපිලක් ද, මැණිකක් ද දරන්නීය. විශේෂයෙන් ජපානයෙහි මහාමයූරී බෝධිසත්ත්ව දෙවඟනගේ ප්‍රතිමා දැකිය හැකි ය.[27]

### මාරීචි බෝධිසත්ත්ව දෙවඟන

වජ්‍රවරාහි, අශෝක කාන්තා යන පර්යාය නම්වලින් ද හඳුන්වන මාරීචි බෝසත් දෙවඟන ආශීර්වාදය ලබා දෙන දෙවඟනක වශයෙන් මහායානිකයන් විසින් වන්දනා කරනු ලබයි. 'ඕම්, මාරීචී! ස්වාහඃ' යනු ඇයට නමස්කාර කරන මන්ත්‍රය යි.

තාරා බෝසත් දෙවඟනකගේ දකුණු පස සිටින මැය සූකරයෙකු විසින් උසුලනු ලබන පද්මාසනයක සිටී. පලාවන් පැහැයෙන් යුත් ඇය හිස් තුනක් සහ අත් දහසකින් යුත්ත ය. දකුණු අතින් අශෝක ශාඛාවක් ද, අනෙකුත් අත්වල වරද මුද්‍රාව සහ විතර්ක මුද්‍රාව ද, වජ්‍රයක් ද, හිඳිකටුවක් ද, හුයක් ද දරන්නී ය. වෛරෝචන බුදුන් හිසින් දරන මාරීචි බෝසත් දෙවඟන පිරිවර බෝසත් දෙවඟනන් සතරක් පිරිවරා සිටිනු ද නිරූපණය වේ.

කාන්තාවන්ට බුදුවිය නො හැකි ය යන අන්‍ය බෞද්ධ නිකායික අදහස ප්‍රතික්ෂේප කරන මහායානිකයන්, මතු බුදුවීමට පෙරුම් පුරන බෝධිසත්ත්ව දෙවඟනන් පිළිබඳ දක්වන ගෞරව සහ උනන්දුව මඟින් ප්‍රකට කෙරෙන්නේ කාන්තාවන් බුදුවිය හැකි ය යන බෝධිසත්ත්වයානිකයන් ඉදිරිපත් කරන සංකල්පයේ ස්ථාවරත්ව යයි. තවද මහායාන බෝධිසත්ත්ව සංකල්පය වටා ගොඩ නැගුණු බොහෝ දාර්ශනික ඉගැන්වීම් මහායාන බුදුදහම හෙවත් බෝධිසත්ත්වයානය වඩාත් ජනප්‍රිය වීමට පාදක වූ බව අපගේ ද අදහසයි.

## ආන්තික සටහන්

1 සෝරත හිමි වැලිවිටියේ, (1970), *ශ්‍රී සුමංගල ශබ්දකෝෂය*, (ද්වීතියභාගය), අභය ප්‍රකාශකයෝ, ගල්කිස්ස, පි. 706

2 එම, පි. 1024

3 Dyal Har, (1964), *The Bodhisattva Doctrine in Buddhist Sanskrit Literature*, Maortilal Banarsias, New Delhi, p. 4-6

4 විමලරතන හිමි බෙල්ලන්විල, (2015), *බුදුවරු සහ බෝසත්වරු*, සරසවි ප්‍රකාශකයෝ , නුගේගොඩ, පි. 80

5 *ප්‍රඥා පාරමිතා සූත්‍රය*, උපුටා ගැනීම; ධම්මතිලක හිමි පැලැන්වත්තේ, (2008), *බෝධිසත්ව සංකල්පය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කේළඹ 10, පි. 47

6 විමලරතන හිමි බෙල්ලන්විල,(200), *ප්‍රඥා පාරමිතා සාහිත්‍යය*, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, පි. 38-39

7 *ප්‍රඥා පාරමිතා සූත්‍රය*

8 එම

9 ධම්මරතන හිමි ඉඳුරාගාරේ (සංස්), (1989), *බෝධිචර්යාවතාරය*, සමයවර්ධන, කොළඹ 10, පි. iv

10 අභිධර්ම සමුච්චය

11 සෝරත හිමි වැලිවිටියේ, (1970), *ශ්‍රී සුමංගල ශබ්දකෝෂය*, (ද්වීතියභාගය), අභය ප්‍රකාශකයෝ, ගල්කිස්ස, පි. 654

12 ධම්මතිලක හිමි පැලැන්වත්තේ, (2012), *චතුර්විධ දර්ශනවාද සම්ප්‍රදය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, පි. 132-133

13 උපුටා ගැනීම, ධම්මතිලක හිමි පැලැන්වත්තේ, (2008), *බෝධිසත්ව සංකල්පය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, පි. 135-136

14 උපුටා ගැනීම, එම, පි. 136-138

15 *සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය*

16 විමලරතන හිමි බෙල්ලන්විල, (2015), *බුදුවරු සහ බෝසත්වරු*, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ, පි. 84

17 එම, පි. 86

18 එම, පි. 88

19 එම, පි. 90-99

20 එම, පි. 100-101

21 එම, පි. 102-103

22 එම, පි. 106-114

23 එම, පි. 116-117

24 පෙරේරා ටෙනිසන් (සංස්), (1995), *නිවන් මඟ*; මහායාන වාදය, රජයෝ මුද්‍රණාලය, පි. 53

25 විමලරතන හිමි බෙල්ලන්විල, (2015), *බුදුවරු සහ බෝසත්වරු*, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ, පි. 120-125

26 සාසනරතන හිමි මොරටුවේ, (2012), *ලක්දිව මහායාන අදහස්*, විසිදුනු ප්‍රකාසකයෝ, බොරලැස්ගමුව, පි. 255

27 එම, පි. 256